ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி, சுஹுருபாய, ஸ்ரீ சுபூதிபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. } DRP/OP/21/15/01 | ඔබේ අංකය / உமது இல. / Your Ref. } | දිනය / திகதி / Date } 2026.04. 09 |

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්
ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්ත පු.ලි.දෙ.සංවර්ධන නිලධාරීන් වෙත

<u>උප්පැන්න සහතිකයක් නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ජාතික හැඳුනුම්පත් ලබා දීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2023 ට අදාළව ඔබ වෙත නිකුත් කරන ලද අංක DRP/OP/01/DS/03 (වෙළුම IV) දරණ 2023.06.05 හා DRP/OP/10/15/03 දරණ 2023.06.05 හා 2024.04.09 දිනැති ලිපි මෙයින් අවලංගු කරමි.

02. උප්පැන්න සහතිකයක් නොමැති වීමේ හේතුව මත මෙතෙක් ජාතික හැඳුනුම්පත ලබා ගැනීමට නොහැකි වී ඇති අස්වැසුම ප්‍රතිලාභීන් හා වැඩිහිටි දීමනාව ලබා ගැනීමට නොහැකි වී ඇති වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් කඩිනමින් ජාතික හැඳුනුම්පත් සකස් කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලෙස සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය හා වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ඉල්ලීමක් කර ඇත.

03. ඒ අනුව, උප්පැන්න සහතිකයක් නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ජාතික හැඳුනුම්පත් ලබා දීමට අදාළව නිකුත් කරන ලද පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2023 හි සඳහන් ඇතැම් කරුණු සංශෝධනය කර නිකුත් කර ඇති 01/2026 චක්‍රලේඛයෙ හි උපදෙස් ප්‍රකාරව මෙතෙක් ජාතික හැඳුනුම්පත ලබා ගැනීමට නොහැකි වූ, වයස අවුරුදු 50 ඉක්ම වූ ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පුද්ගලයන් විසින් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි අතර එම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි අවසන් දිනය 2026.12.31 දින වන බව කාරුණිකව දන්වමි.

04. එබැවින්, ඔබ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පුද්ගලයන් මේ පිළිබඳව දැනුවත් කර 2026.12.31 දිනට ප්‍රථම අදාළ ඉල්ලුම්පත් යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එම්.එස්.පී.සූරියප්පෙරුම
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ.)

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| 02. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - කරු.දැ.ගැ.ස. |
| 03. | විගණකාධිපති | - කරු.දැ.ගැ.ස. |
| 04. | සියලුම මාණ්ඩලික නිලධාරීන් (පු.ලි.දෙ.) | - කරු.දැ.ගැ.ස. සහ කාර්ය මණ්ඩය දැනුවත් කිරීම සඳහා |

දුරකථන / தொலைபேசி / Telephone } (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax } (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@drp.lk
වෙබ් / இணையதளம் / Web } www.drp.gov.lk